**ශීර්ෂය 319 - සබරගමුව පළාත් සභාව**

## 1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

සබරගමුව අනභිබවනීයත්වයට.

### 1.2 මෙහෙවර

සබරගමුව ජනතාවගේ අභිවෘද්ධිය සඳහා සියලුම සම්පත් ඵලදායීව හා ගුණාත්මකව කළමනාකරණය කිරීම තුළින් සබරගමුව අභිමානවත් පෙරගමනකට.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. වාර්ෂික මූල්‍ය ප්‍රකාශන

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

සබරගමුව පළාත් සභාව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 26,727 ක් වු අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 24,930.1ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,796.9 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6.72 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2019 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 23,212 | 23,212.00 | - | - |
| මුලධන | 3,515 | 1,718.10 | 1,796.90 | 51.12 |
| එකතුව | 26,727 | 24,930.10 | 1,796.90 | 6.72 |

3. විගණන නිරික්ෂණය

-----------------------

විසර්ජන පනතින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය පිළිබඳ තොරතුරු ඇතුළත් වැය ලෙජරයන් පවත්වා නොතිබීමත්, අග්‍රිම ගිණුමක් පවත්වා නොතිබීමත් නිසා පාර්ලිමේන්තු ප්‍රතිපාදනය වැය විෂයයන් අනුව පරික්ෂා කිරිමට නොහැකි විය. මෙම ප්‍රතිපාදනයන් පළාත් සභාවේ අරමුදල යටතේ උපයෝජනයන් සිදු කර ඇති බැවින් එම වියදම් පිළිබඳ විගණන නිරික්ෂණයන් පළාත් සභාවේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව වූ විගණකාධිපති වාර්තාවේ ඇතුළත් වේ. එම වාර්තාව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව යථා කාලයේ දි පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.